# පොල් වගාව හා රාජ්‍ය ප්‍රතිපත්ති (උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**එම්.පී.අයි.ප්‍රතිභා** [1]

**පී.එම්.හේනෙගෙදර** [2]

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකික ජනතාවගේ ආර්ථිකය සවිබල ගන්වන වගාවන් අතර පොල් වගාවට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. සමස්ත පොල් වගාවෙන් 82% කුඩා පරිමාණයේ පොල් ඉඩම් වන අතර එම වගාකරුවන් පොල් මිල ස්ථාවර නොවීම, පැළවල ගුණාත්මකභාවය අවම වීම, පොල් ඵලදාව අඩු වීම, පලිබෝධ හානිවලට මුහුණපෑම වැනි අර්බුදයන්ට මුහුණ දී ඇත. ඒ තත්වයෙන් ඔවුන් මුදවා ගැනීමට රජය විසින් නැවත වගා හා යටි වගා සහනාධාර ලබාදීම, පොල් පැළ සහන මිලට සැපයීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන් පොල් වගාව සංවර්ධනය කර ගැනීමට කෙතරම් දුරට දායක වීද යන්න මෙම අධ්‍යයනයෙන් සොයා බැලීමට අරමුණු කෙරේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර සියඹලාගස්රුප්ප ග්‍රාම නිලධාරී වසමට අයත් පොල් වගාකරුවන් 20ක් සසම්භාවීව තෝරා සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මාර්ගයෙන් ප්‍රාථමික දත්තයන් ලබා ගැනුණි. පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රකාශිත පත්‍රිකා, පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා, පොල් වගා කිරීමේ මණ්ඩලයේ වාර්තා, මහ බැංකු වාර්තා, සඟරා සහ අන්තර්ජාලය භාවිතා කිරීමෙන් ද්විතීයික දත්ත ලබා ගැනුණි.

සමීක්ෂණ දත්තයන්ට අනුව වගාකරුවන්ගෙන් 80%කට රජයේ සහනාධාර වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවයක් නොමැති අතර 20% වැනි සුළු පිරිසකට පමණක් මේ යටතේ ප්‍රතිලාභ ලැබී ඇත. නැවත වගා හා යටි වගා සහනාධාර, පොල් පැළ සහන මිලට ලබා දීම යන වැඩසටහන් යටතේ පමණක් සහනාධාර ලබාගෙන ඇත. පොල් වගාකරුවන් 85%ක් පමණ පොල් වගා කරනුයේ තමන්ගේ අත්දැකීම් පදනම් කරගෙන වන අතර ඉතිරි 15% පොල් සංවර්ධන නිලධාරින්ගේ උපදෙස් මත වගා කටයුතුවල නියැලෙන බවක් පෙනුණි. පවතින පොල් අක්කරයක් නඩත්තුව සදහා වසරකට රු.82456/= ක පිරිවැයක් දරන අතර වාර්ෂික ආදායම රු.75600/= පමණ වේ. ඒ අනුව ලාභය රු.18770/= ක් බව මින් ගම්‍ය කර ගත හැකි විය.

රජය මැදිහත් වී පොල් වගාව ප්‍රවර්ධනය සඳහා සහනාධාර වැඩසටහන් ස්ථාපිත කළ ද ඒවා ඵලදායීව, කාර්යක්ෂමව හා සාධාරණව ඉටු වන බවක් නොපෙනේ. මේ අනුව රජය විසින් ක්‍රියාත්මක කරන්නා වූ සහනාධාර වැඩසටහන් පිළිබඳව සමස්ත වගාකරුවන් දැනුවත් කිරීම, ගුණාත්මක භාවයෙන් යුත් පොල් පැළ හා පොහොර ලබාදීම, පොල් සදහා ස්ථාවර මිලක් ලබාදීම, කාබනික පොහොර භාවිතය දිරිගැන්වීම මගින් පොල් වගාවේ අනාගතය සාර්ථක කර ගැනීමට හැකිවනු ඇත.

මුඛ්‍ය පද : පොල් වගාව, වගාකරුවන්, සහනාධාර, වැඩසටහන්

*1. ආර්ථික විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*